95

# ශ්‍රී ලංකාවේ සඳකඩපහණේ

# විකාශනය

ඒ. ඒ. ඩී. අමරසේකර


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 95 |
| වර්ග අංකය | |


කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධිකාවයි.

1988 මාර්තු

## සාරාංශය

### ශ්‍රී ලංකාවේ සඳකඩපහනෙ විකාශනය

සඳකඩපහණ ලංකා කලාවේ හා ගෘහ නිර්මාණයේත් අතිශයින් ප්‍රකට හා විශිෂ්ටතර වූද අංග අතරින් එකකි. කෙසේ නමුත් මේ නිර්මාණය පිළිබඳ ව ඊට අළුම් කළවුන්ගේ අවධානය වසර සියයකට නොඅඩු කලක් යොමු ව පැවතුනද, විධිමත් වූත්, පරිසමාප්ත වූත් අධ්‍යයනයක් සඳකඩපහණ විෂයෙහි මේ දක්වා සැළසී නොමැත්තේය. මෙම නිබන්ධයෙහි දී වසර 1500 කට නොඅඩු ඓතිහාසික කාල පරිච්ඡේදයක් තුළ ශ්‍රී ලංකාවේ සඳකඩපහනේ ප්‍රභවය, වර්ධනය, වර්ගීකරණය, කාර්යය හා සංකේතාර්ථය අධ්‍යයනය කරමින් එම පරතරය පුරවාලීමට උත්සාහයක් දරා ඇති ප්‍රයත්නයන් ද විශේෂයෙන් ම එහි සංකේතාර්ථය, ප්‍රභවය පිළිබඳ ගැටළු තැන් හා ප්‍රායෝගික උපයෝගිතාව පිළිබඳ ව ඔවුන්ගේ අර්ථනිරූපණ ගැන කරුණු දක්වමින්, මූලික වශයෙන් ම පෘථුල ක්ෂේත්‍ර කටයුතු හා වාතීගත කරන අධ්‍යයනයක් තුළින් මේ විෂය පිළිබඳ විධිමත් විස්තරයක් ගෙන හැර පෑමට යත්න දරා තිබෙයි.

අර්ධ කවාකාර ගල් පුවරුවක් වශයෙන් පවත්නා සඳකඩපහනේ (පාලි,: පාටික: සිංහල: සඳකඩපහණ හෙවත් ''අඩසඳ පහණ'') සම්භාව්‍ය නිමවුම්, වැදගත් ආගමික හෝ රාජකීය මන්දිරයකට පිවිසෙන පියගැට පන්තියක පාමුල පිහිටුවා තිබේ. සඳකඩපහනේ වර්ධනය පිළිබඳ මුල් අවස්ථාවක දී පාදෝවනය වැනි විවිධ කාර්යයන්ට ඉඩ සලසන පියගැට පෙලක පහත් ම පියගැටය ඉඩකඩ සහිත වඩා පුළුල් වූවක් වශයෙන් නිමවන ලද බවට සාධක තිබේ. එසේ ම මෙම විශාල වීමත් සමග ම එය ක්‍රමයෙන් අර්ධ වෘත්තාකාර වෙමින් අංග සම්පූර්ණ සඳකඩපහණක් බවට විකාශනය වී ඇත. මෙම පරිණාමය හා සඳකඩපහනේ ප්‍රභවය පිළිබඳ ව විද්වතුන් විසින් පළකොට ඇති විවිධ අදහස් සමාලෝචනය කරමින් සඳකඩපහනේ ප්‍රභවය, ප්‍රායෝගික අභිමතාර්ථයන් හා වර්ධනය යන අංශ ගැන අප බැසගත් නිගමන විමසුමට ලක් කිරීම පළමු පරිච්ඡේදයෙන් අරමුණු කෙරේ. මූලික වශයෙන් ම සඳකඩපහණ නම් වූ ගල්පුවරුවේ ප්‍රායෝගික උපයෝගීතාව එහි ප්‍රභවය හා වර්ධනය පදනම් කරගෙන නිර්මාණය වූවක් වන්නට ඇතිමුත්, එම අරමුණ පමණට ම වැදගත් කලාත්මක වටිනාකමක් ද ඊට ආරෝපනය කරන ලද්දේය.

සඳකඩපහණ ශ්‍රී ලංකාවට ම සීමා වූ නිමවුවක් නොවූවත් මේ හේතුව නිසා ම එය ශ්‍රී ලංකාවෙහි දී අසල්වැසි භාරතයේ අන් කවර තැනකටත් වඩා විශේෂවූත්, විශිෂ්ඨවූත් වර්ධනයකට යොමු වූයේය.

කැටයම් රහිත හා සහිත සඳකඩපහණට වසර එක්දාස් පන්සියකට නොඅඩු දීර්ඝ කාලීන සංවර්ධිත ඉතිහාසයක් හා කලාත්මක වර්ධනයක් ද තිබේ. මුලින් ම ඇතිවූ කැටයම් රහිත සඳකඩපහණ සිව්රැස් ගල් පුවරුවක සිට අර්ධ වෘත්තාකාර පුවරුවක් දක්වා අනුරාධපුර යුගයේදී පරිණාමය වූයේ කෙසේද යන්නත්, කැටයම් රහිත සඳකඩපහණක් කැටයම් සහිත නිමවුමක් බවට පරිවර්තනය වූයේ කෙසේද යන්න හා එසේ පරිවර්තනය වීමට හේතු කාරක වූයේ මොනවාද යන්නත් දෙවන පරිච්ජේදය යටතේ විමර්ශනය කෙරේ.

තෙවන පරිච්ජේදයේ අරමුණ වනුයේ සඳකඩපහනේ කැටයම් කරණයේ මූලාවස්ථාව හා පශ්චාත් අනුරාධපුර සමයේ දී එය කැටයමින් පරිපූර්ණ නිමවුමක් බවට පත්වීම යන ප්‍රධාන කරුණු දෙක අතර වූ විවිධ වර්ධන අවස්ථා හඳුනා ගැනීමයි. වෙනත් අයුරකින් කිවහොත් සඳකඩපහණට මුලින් ම එක් වූ කැටයම සේ ගත හැකි මධ්‍යගත අඩ පියුමේ සිට, කාලයාගේ ඇවෑමෙන් එයට කැටයම් තීරු එක්වෙමින් පශ්චාත් (පසු) අනුරාධපුර සමයේ දක්නා ලැබෙන මුළුමනින් ම කැටයමින් ගැවසි සඳකඩපහණ දක්වා එය පරිණාම වූයේ කෙසේද යන්න මෙහිදී විමසුමට ලක් කෙරේ.

මෙසේ සඳකඩපහණ අනුරාධපුර සමයේ පසු භාගයේ කලාත්මක නිමවුමක් බවට පත්වීමට තුඩුදුන් දාර්ශනික සංකල්ප හා එහි ප්‍රතිඵලය වූ සඳකඩපහනේ සංකේතාර්ථයනුත් මීළඟට එන සිව්වැනි පරිච්ජේදය යටතේ විමසුමට බඳුන් වේ. සඳකඩපහනේ කැටයම් තුලින් ප්‍රාචීන යේ ගොඩබිම හා ජලජ ශාඛ හා සත්ව සන්තතිය නියෝජනය වන වගටත්, එතුලින් සම්‍යක්ත්වය පිළිබඳ පණිවුඩයක් සන්නිවේදනය වූ වගටත් අනුමාන නිගමනයකට එළඹීමට අපට හැකියාව සැළසිණි. එසේ වුව ද සඳකඩපහණ නිම වූ කලා කරුවන් සැමවිට ම සෑම සඳකඩපහණක් තුලින් ම මෙම සංකේතාර්ථය ගෙනදීමට උත්සාහ දැරුවේ ද යන්න නිශ්චය වශයෙන් ම පැවසිය නොහැකිය. ඇතැම්විට මූලික සංකේතාර්ථය හිතේ රුවාගෙන කලා කරුවා අවැසි පරිදි එහි කැටයම් නොයෙක් අයුරින් හැඩගැසුවා වීමට ද බැරි නැත.

පස්වන පරිච්ඡේදය යටතේ විමර්ශනය කෙරෙනුයේ පොළොන්නරු යුගයේ සඳකඩපහනේ කැටයම් කවර ස්වරූපයකින් ඉදිරිපත් වූයේද යන්නත්, එම දාර්ශනික හා සංකේතාත්මක පසුබිම අනුරාධපුර සඳකඩපහණෙන් වෙනස් වන්නේ කුමන අංශ කෙරෙන් ද යන්නත්ය. සමකාලීන හින්දු ආගමික සහ දේශපාලනික සමාජය තුළින්, සඳකඩපහණ වැනි කැටයම් කලා නිර්මාණ තුළට කෙබඳු බලපෑමක් ඇති කළේද යන්නත් සන්සන්දනාත්මක ව මෙහි ලා අධ්‍යයනය කෙරේ.

පශ්චාත් පොළොන්නරු යුගයේ දී කලාත්මක වටිනාකම මෙන් ම සඳකඩපහනේ දාර්ශනික පසුතලයත් ක්‍රමික පරිහානියකට පත්වන බවත් සිතිය හැකි අතර, පෙර පමණට ම උසස් නොවූ කලාත්මක අගයක් මේ යුගයේ සඳකඩපහන්හි සිව්පාවුන් හා පක්ෂීන් වැනි ජීවීන් ට උරුම වූ අගය ක්‍රමයෙන් ගිලිහී යාමත්, උද්භිද අලංකරණ විෂයෙහි වැඩි අගයක් ආරෝපණය වීමත් මේ යුගවල සඳකඩපහන් තුළින් මැනවින් කැපී පෙනෙයි. මෙකී කරුණු පිළිබඳ ව විමර්ශනය කිරීම හවැනි පරිච්ඡේදයෙන් අපේක්ෂිතය.

මෙම විෂය සම්බන්ධයෙන් මෙතෙක් දක්වන ලද කරුණු නිගමනය යටතේ නැවත සමාලෝචනය කෙරේ. උප ග්‍රන්ථය වෙන් ව පවත්නේ රූප සටහන් මඟින් දක්වනු ලැබ ඇති තෝරාගත් සඳකඩපහන් 58 ක් පිළිබඳ විස්තරාත්මක සටහන් ගෙනහැර දැක්වීම විෂයෙහිය. විවිධ යුගවලට අයත් සඳකඩපහන් 208 ක් රේඛා චිත්‍ර හා ඡායා රූප අනුසාරයෙන් වාර්තාගත කරන ලද අතර, ශ්‍රී ලංකාවෙන් හමුවන විවිධ සඳකඩපහන්වලින් තෝරාගත් උදාහරණ, රූප සටහන් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ. කැටයම්න් සරසන ලද, සඳකඩපහන් උදාහරණ, 104 ක් මීට ඇතුළත්ය. අවසාන වශයෙන් තෝරාගත් ග්‍රන්ථ නාමාවලිය තුළින් සඳකඩපහණ පිළිබඳ ව පරිශීලනය කළයුතු සිංහල හා ඉංග්‍රීසි ලිඛිත කෘති පිළිබඳ මාර්ගෝපදේශකත්වයත් සළසා තිබේ.

## ABSTRACT

## The Evolution of the Moonstone in Sri Lanka

The moonstone is one of the best-known and most distinctive elements in the art and architechture of Sri Lanka. Although it has attracted art-lovers for more than a hundred years, no systematic and overall study of the moonstone has been carried out hitherto. This dissertation attempts to fill that gap by studying the origin, development, typology, function and symbolism of the Sri Lankan moonstone over a historical period of more than 1500 years. While paying attention to the work of previous scholars, especially with regard to the interpretation of its symbolism and to the question of its origin and function, this study is based on extensive fieldwork and documentation and tries to present a systematic, descriptive study of its subject.

In its classic form, the moonstone (Pali: paṭikā; Sinhala: sa̐ndakaḍapahaṇa or 'half-moon-stone') is a semicircular stone slab, placed at the bottom of a flight of steps leading to the entrance of an important religious or royal edifice. There is evidence that at an early 'pre-developmental' stage in the evolution of the moonstone, the lowermost step of a flight of stairs was made wider than the rest of the steps, in order to serve a variety of practical functions, such as the ritual washing of feet and the provision of stable foundations for the stairs. This broad step evolved gradually to assume the characteristic crescent or half-moon shape of the fully-developed moonstone.

In the first chapter of this dissertation, an attempt is made to investigate the origin and function of the moonstone and its development as an architectural feature, examining the views put forward by scholars on these matters. Although its functional aspects seem to have been fundamental to its origin and development, the moonstone embodied equally important artistic and symbolic aspects. While the concept of the moonstone is not unique to this country, the Sri Lankan moonstone, with its high artistic quality, evolved in a distinctive and unique manner, when compared with the development of this feature in the architecture of India.

The moonstone, in both its decorated and un-decorated forms, has a long artistic development and evolutionary history of not less than 1500 years. The second chapter deals with the question of how and why the plain and the square 'moonstone' developed into a feature

displaying the well-known semicircular shape and the way in which this semi-circular form evolved into an elaborate, highly-ornamented feature, during the Anurādhapura period.

The third chapter is directed at investigating the various developmental phases in the sculptural ornamentation of the moonstone in the latter phases of the Anurādhapura period and especially how the original carving of the central half-lotus developed into a fully-ornamented crescent form with multiple bands of sculptured decoration.

In the fourth chapter, the philosophical concepts and symbolic meaning of the decorated moonstones of the Late Anurādhapura period are examined. The hypothesis that is put forward, tentatively, is that the carving possibly represents concepts of land, water, life and fertility, although this specific interpretation does not necessary apply to every moonstone form. It may also be the case that the designers and sculptors, though aware of the underlying symbolic meanings, used the motifs more for their aesthetic character, than for their particular symbolic connotations.

The fifth chapter is devoted to an analysis of two important aspects of the moonstones of the Polonnaruva period, the distinctive mode of presentation of the ornamental motifs and differences in the philosophical and symbolic concepts attached to such motifs when compared with those of the Anurādhapura period. An attempt is also made to examine the influence of contemporary South Indian-Hindu religious and political values on moonstone ornamentation at Polonnaruva.

The moonstones of the post-Polonnaruva period form the subject of the sixth chapter. Though a certain degree of artistic quality has been maintained during this period, it is clear that the aesthetic standards and the rich philosophical background of the moonstones of the Anurādhapura and Polonnaruva periods show a gradual decline in the later period. The most distinctive feature of the moonstones of this later period is the fact that the animal and bird motifs, which were the hallmark of the Anurādhapura and Polonnaruva moonstones, have been almost entirely replaced by elaborate floral designs.

The Conclusion reviews the overall investigation of the subject. An Appendix provides descriptive notes on 58 selected moonstones, which are all illustrated. The line-drawings and photographs provide illustrative documentation of a total of 208 moonstones belonging to various periods, forming a representative sample of the various moonstone forms found in Sri Lanka. This includes 104 examples of moonstones with sculptured decoration. Finally, the Select Bibliography provides a guide to the literature on the moonstone in Sinhala and English.

Dayanada Amarasekara
Department of Archaeology
University of Kelaniya
February 1988